දෙපාර්තමේන්තු නියෝග 04/2017

මගේ අංකය : පා/1/2/5/1
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.04. 28

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන ගණකාධිකාරී/ අතිරේක අධ්‍යක්ෂවරුන්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
පරිපාලන නිලධාරීන්,
ඒකක / ශාඛා ප්‍රධානීන්.

## <u>මූලික විමර්ශන පැවැත්වීම විධිමත් කිරීම</u>

ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ විනය කාර්ය පටිපාටි රීති 1.2 වගන්තිය යටතේ නිලධරයන් අතින් සිදු වන්නා වූ ද, කවරාකාරයකින් වුවද දඬුවම් පැමිණවිය යුතු වූ ද, සියළුම විෂමාචාර ක්‍රියාවන් හෝ ප්‍රමාද දෝෂයන් හෝ සම්බන්ධයෙන් හැකිතාක් ඉක්මනින් විනය බලධරයන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අදාල අනෙකුත් ආයතන ප්‍රධානීන් විසින් ක්‍රියා කළ යුතුය. අදාල විෂමාචාරයන් හෝ ප්‍රමාද දෝෂයන් පිළිබඳව සැපයිය යුතු සෑම ආකාරයකම වාර්තා හා තොරතුරු කඩිනමින් අදාල විනය බලධරයන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අදාල අනෙකුත් ආයතන ප්‍රධානීන්ට සැපයීම එම නිලධරයා සේවයේ යෙදී සිටින ආයතනයේ එම නිලධරයා සම්බන්ධයෙන් අධීක්ෂණ හෝ පාලන හෝ බලයක් ඇති නිලධරයෙකුගේ හෝ නිලධරයන්ගේ හෝ වගකීම වන්නේය. එම වගකීම පැහැර හැරීම ද විනයානුකූලව කටයුතු කළ යුතු වන විෂමාචාරයක් වන්නේය.

02. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13.1 වගන්තිය අනුව මූලික විමර්ශනයක් යනු කිසියම් රජයේ නිලධරයෙක් හෝ නිලධරයන් කීපදෙනෙකු හෝ විසින් විෂමාචාරයක් සිදු කර තිබේද යන්න පිළිබඳ සැකයක් ඇති වූ විට හෝ තොරතුරු ලද වහාම හෝ ඒ පිළිබඳව නියම තතු හෙළිදරව් කර ගැනීමට අවශ්‍ය මූලික සාධක සොයා ගැනීමත්, සැකයට පාත්‍රව සිටින නිලධරයාට හෝ නිලධරයන්ට හෝ විරුද්ධව චෝදනා ඉදිරිපත් කර විනයානුකූලව ක්‍රියා කිරීමට තරම් බැරෑ බැල්මට පෙනී යන ආකාරයේ ප්‍රමාණවත් කරුණු හා සාක්ෂි සොයා ගත හැකිද යන්න සොයා ගැනීම සඳහා විධිමත් බලධරයෙකු විසින් හෝ එකී බලධරයන්ගේ නියෝග මත ඒ සඳහා පත් කරනු ලැබූ නිලධරයෙකු විසින් හෝ නිලධර කමිටුවක් විසින් හෝ ඒ පිළිබඳ සොයා බලා වාර්තා කිරීමයි.

03. දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ/ අතිරේක අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන්ගේ නියෝග මත මූලික විමර්ශන පවත්වා, නිර්දේශ සහිත විමර්ශන වාර්තාව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවයක් මෑත කාලයේ දක්නට ලැබුන අතර, එකී වාර්තාවන්හි පැවති විවිධාකාර අඩුපාඩු හේතුවෙන් එම අඩුපාඩු සකස් කර ගැනීම සඳහා ඒ ඒ අදාල අංශ වෙත යොමු කිරීමට සිදු වූ අවස්ථා බහුල වන අතර, එසේ වුවද ඇතැම් අඩුපාඩු නිසි පරිදි සැකසී නොමැති අවස්ථා ද දක්නට ලැබුනි. එසේම ඇතැම් විමර්ශන වාර්තාවන්හි අන්තර්ගතයේ පවතින ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ද සෑහීමකට පත් විය නොහැකි අතර, එකී වාර්තාවන් ඇසුරින් යම් නිගමනයකට එළඹීම දුෂ්කර වන අතර, එමගින් මූලික විමර්ශන පැවැත්වීමේ අරමුණ ද ඉටු කර ගත නොහැකි වේ.

04. එබැවින් ඉදිරියේදී ඔබ ආයතනයෙහි ඇති වන විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධයෙන් අප්‍රමාදව ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කර, ලැබෙන උපදෙස් පරිදි ක්‍රියා කිරීමටත්, බලය පැවරීමකින් තොරව අධ්‍යක්ෂ අංශ/ ආයතන/ ඒකක විසින් මූලික විමර්ශන පැවැත්වීමෙන් වලකින ලෙසටත්, ඉහත දැක්වූ දූර්වලතාවයන් මඟහරවා ගෙන මූලික විමර්ශන පැවැත්වීමේ අරමුණු ඉටු කර ගත හැකි වන පරිදි විධිමත්ව මූලික විමර්ශන පැවැත්වීමටත් අවශ්‍ය පියවර ගන්නේ නම් මැනවි.

05. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ වන සියළුම ආයතන/ මධ්‍යස්ථාන/ ඒකකයන්හි සියළු නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ක්‍රියාත්මක වීමෙන් වඩාත් ඵලදායී සේවාවක් ලබා දීමට සහ ලබා ගැනීමට දායක වන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එච්.පී. දයා මැණිකේ සරත්චන්ද්‍ර.
ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය).
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන).
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත් :
01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීමට.
02. විගණකාධිපති - එම